Sinhalese: Introduction to the Refugee Minor Program

# සිංහල: සරණාගත බාල වයස්කරුවන් පිළිබඳ වැඩ සටහන සඳහා හැඳින්වීම

සරණාගත බාල වයස්කරුවන් පිළිබඳ වැඩසටහන (Refugee Minor Program, (RMP)) මගින් වික්ටෝරියාවේ දෙමාපියන් නොමැතිව වෙසෙන සරණාගත ළමුන් හා වයස18ට අඩු තරුණ අය වෙනුවෙන් උපකාර සපයනු ලැබේ. 'හුදකලාවූ මානුෂීය (හෝ සරණාගත) බාලවයස්කරුවන්' ('Unaccompanied Humanitarian, or Refugee, Minors', (UHM's)) ලෙස ඔවුන්ව හඳුන්වනු ලැබේ.' වික්ටෝරියාවේ වෙසෙන UHM සේවා දායකයන් RMP වෙත යොමු කිරීමට තීරණය කරනු ලබන්නේ සංක්‍රමණය හා පුරවැසිභාවය පිළිබඳ දෙපාර්තමේන්තුව (Department of Immigration and Citizenship, (DIAC)) මගිනි.

UHM සේවා දායකයන් වර්ග තුනකි

- **Non–wards** යනු ඔවුන්ව රැකබලා ගැනීමේ වගකීම භාර ගැනීමට කැමති වයස අවුරුදු 21ට වැඩි සමීප ඥාතියෙකු මෙහි සිටින අයයි. DIAC විසින් එම ඥාතීන්ගෙන් 'රැකබලා ගැනීමේ පොරොන්දුවක්' අත්සන් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

- **Wards** යනු ඔවුන්ව රැකබලා ගැනීමේ වගකීම භාර ගැනීමට කැමති (වයස අවුරුදු 21ට වැඩි) සමීප ඥාතියෙකු ඕස්ට්‍රේලියාවේ නොමැති අයයි. සංක්‍රමණය පිළිබඳ ඇමතිවරයා ඔහුගේ නීතිමය භාරකරු බවට පත්වන අතර, මානව සේවා දෙපාර්තමේන්තුව (Department of Human Services, (DHS)) වෙත (RMP හරහා) පවරාගත් භාරකරුවෙක් ලෙස කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. (සංක්‍රමණ ළමුන්ගේ භාරකත්වය පිලිබඳ පනතේ 5(1) වගන්තිය (*Immigration Guardianship of Children* (IGOC) Act).

- **Unaccompanied asylum seeking minors** (හුදකලාවූ රැකවරණය පතන බාල වයස්කරුවන්) යනු දෙමව්පියන් හෝ පවුලේ අය නොමැතිව හා ඕස්ට්‍රේලියානු බලධාරීන්ගේ පූර්ව අවසරයක් නොලබා ඕස්ට්‍රේලියාවට ඇතුළුවී සරණාගත ප්‍රඥප්තියට අනුව සරණාගත තත්වය සඳහා ඉල්ලුම් කරන ළමුන් හා වයස 18ට අඩු තරුණ අය වේ. අනුමත කළ විසා තත්වය ඔවුනට නොලැබෙන අතර ප්‍රජා රැඳවුම හෝ විකල්ප රැඳවුම යටතේ සිටින අය ලෙස වර්ගීකරණයට ලක්වීමට හෝ සම්බන්ධ කිරීමේ වීසා (bridging visa) දැරීමට හැකිය.

රැකවරණය පතන බාලවයස්කරුවන් ප්‍රාන්ත හා ප්‍රදේශ වලට පවරාදීමට ඉඩ සළසමින් 2008 ජුනි 13 වැනිදා සංක්‍රමණ (*ළමුන්ගේ භාරකාරීත්වය*) පවරාදීම 2008 (පවරාදීමේ ලියවිල්ල) යාවත්කාලීන කොට සංක්‍රමණය පිළිබඳ ඇමතිවරයා විසින් අත්සන් තබන ලදී. මෙමගින් හුදකලාවූ රැකවරණය පතන බාලවයස්කරුවන්ගේ (Wards ලෙස හඳුනාගත් අයගේ) කොමන්වෙල්ත් රජයේ භාරකාරත්වය RMP වෙත පැවරීමට ඉඩ සළසනු ලැබේ.

එවැනි අවස්ථාවලදී RMP හි කාර්යභාරය වන්නේ එම කරුණු දැඩි අවධානයෙන් සළකා බැලීම හා DIAC සමග කතිකා කොට තීරණයකට එළඹීම වන අතර එකී කරුණු ගැන සොයා බැලීම, තක්සේරු කර අපේක්ෂිත රැකබලාගන්නන් අනුමත කිරීම; තක්සේරුවේ ප්‍රතිඵල DIAC වෙත ඔවුන්ගේ අවධානය සඳහා වාර්තා කිරීම හා නිර්දේශ කිරීම; සහ රැකබලාගන්නන් හා ළමයා/තරුණ පුද්ගලයා සමග කටයුතු කිරීම ආදියද එහි කාර්යභාරයට ඇතුලත් විය හැකිය.